# ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි නිරූපණය වන හින්දු සභ්‍යත්වය පිළිබඳ අධ්‍යයනයක්

*ප්‍රේමරත්න, ඩී. ජී. දේවින්ද ප්‍රභාත් ශ්‍රී* [1]

ඉන්දියාව නිජබිම කරගත් හින්දු ආගමේ සම්භවය හා සංවර්ධනය මෙය යයි නියත වශයෙන් දින වකවානු දැක්වීම ඉතා දුෂ්කරය. එහෙත් වේද සහ වෛදික ආගම හින්දු ආගමේ සහ හින්දු ශිෂ්ටාචාරයේ පිහිටි තලය යැයි සාමාන්‍යයෙන් පිළිගනු ලැබේ. යටකී වේදයන්හි වෛදික සමයට පෙර පැවති සංස්කෘතිය ගැන සඳහන් වී ඇත. විසිවන සියවසේ මුල භාගයෙහි ඉන්දියාවේ සිදු කරන ලද පුරා විද්‍යාත්මක කැණීම්වලින් එතෙක් කල් හුදු සඳහන් කිරීම්වලට පමණක් සීමාව තිබූ ප්‍රාග් වෛදික සංස්කෘතීන් පිළිබඳ තොරතුරු අනාවරණය විය. විද්වතුන් විසින් මෙය ඉන්දු නිම්න ශිෂ්ටාචාරය ලෙසත්, පසුව හරප්පා ශිෂ්ටාචාරය ලෙසත් නම් කරන ලදි. හරප්පා ශිෂ්ටාචාරය ක්‍රි. පූ. 2500-1500 අතර කාලයේ ඉන්දු නදී නිම්නයෙහි පැවති ඓතිහාසික සභ්‍යත්වයකි. මෙය ව්‍යාප්තව තිබූ පංජාබයේ රාවි ගංතෙර පිහිටි හරප්පා නම් තැන දුම්රිය මාර්ගයක් තැනීමේ නිරතව සිටි බ්‍රිත්වන් හට පැරණි නගරයක නටඹුන් හමුවිය. ඒ පිළිබඳව අවධානය යොමු කළ පුරාවිද්‍යාඥයෝ කැණීම් ආරම්භ කළහ. අනතුරුව ලර්කානා ප්‍රදේශයේ කළ කැණීම්වලින් පුරාවස්තු හමු වූ අතර, එකී ප්‍රදේශය **'මොහෙන්ජොදාරෝ'** නමින් හඳුන්වනු ලැබුණි. මේ අනුව විශාල ප්‍රදේශයක් පුරා පැවති පෞරාණික අනාර්ය ශිෂ්ටාචාරයක තොරතුරු අනාවරණය විය. මෙහි ඇති විශේෂත්වය නම් එකී නටඹුන්වලින් හින්දු සභ්‍යත්වයට අදාළ තොරතුරු හමුවීමයි. මෙහිදී පුරාවිද්‍යා හා සාහිත්‍ය මූලාශ්‍රය පදනම් කරගෙන ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙහි හින්දු සභ්‍යත්වයට අදාළ මූලබීජ පැවතුණාය යන්න සනාථ කිරීම පිණිස විධිමත් අධ්‍යනයක් සිදු කිරීමට බලාපොරොත්තු වේ.

**ප්‍රමුඛ පද :** හින්දු ආගම, ශිෂ්ටාචාරය, පුරාවිද්‍යාව, සභ්‍යත්වය, නටඹුන්

[1] *ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*devindaprabhathsri@gmai.com*